දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2013 පරීක්ෂණය - 2016 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part II 2013 Examination – January/February 2016

## සිංසා 3.1 - සම්භාව්‍ය සිංහල ගද්‍ය කාව්‍යය
## SLG 3.1 - Classical Sinhala Prose

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය)**

---

01. i. පහත දක්වෙන ඡේද වත්මන් සිංහලයට නගන්න.
    ii. ඉරි ඇඳි පදවලට විවරණ සපයන්න.

(අ) මහසත් පැදුන් දස බලා ගොස් එක් වෙයෙකැ බැසැ "මා පියවර දිට්ඨමඞ්ගලිකාවට පැනෙවයි, ඇත් අස් ආදීන් විසින් නො මැකෙව" යි ඉටා <u>කෙණෙසිඅහර</u> සිඟා-ගෙනැ එක් සාලායෙකැ වළඳති. එ නුවරැ දෙවියෝ "අප ගෙ සිල්වත් ගුණවත් වහන්සෙට ඔහු බුණු සෙ නො යෙදෙ"යි දැහැවැ ගියහ. ඔවුන් කෙරෙහි නායක යක් දරුවා ග්‍රීවා ගෙනැ පෙරළා තිබි යැ. සෙසු යක්හු සෙසු බමුණන් ග්‍රීවා ගෙනැ පෙරළා තුබුහ. "මෙ මහපුරිසා පිතැ" යි මෙළෙක් සිතින් (කුමරු) නො මැරුහ. කුමරහු මුහුණ පෙරැළී පිටි පස් බලා තුබුයෙ යැ. ඇස් පෙරැළී මළ මිනිසුන් ඇස් වැනි වි යැ. මියෙන් කෙළ පෙණ වැහෙයි. සිරිර තද වි යැ. අත්-පා දැඩි වී. සෙසු බමුණො මියෙන් පෙණ නඟමින් පෙරැළි-පෙරැළී අත්-පා සපත්! ඔහුගෙ පරිජනයො ගොස් එ පවත් දිට්ඨමඞ්ගලිකාවට කීහ. හො වෙළෙවි වැ පහයින් බැසැ ගොස් "ම-පුත හට මෙ කළාහු කවරහ!" යි කීව. ජනයොඃ මෙයට ආ පහුල් පෙරෙවි මහණෙකැ මෙ කෙළෙ" යි කීහ. හො එ අසමින් මැ, "අනෙක් කෙනකුන් ගෙ බල නො වෙයි.

(අමාවතුර, කෝදාගොඩ ඤාණාලෝක හිමි සංස්.)

(ආ) සක්වළගල මැඩැ ගෙණැ අකනිටාබඹලෝ පැනැ ගෙණැ මහපොළොව ඉක්මවා ගෙණැ දිවන සවණක් සනබුදුරසින් මුළු ලොව හැලළෙන්නට වන. මුළුලොව කසමල්කැනින් වසන්නාසේ, දියමෙරලියමලින් නවහම් කරන්නා සේ, මොනරපිලින් සදන්නා සේ, ඉඳුනිල්මැණිකින් අතුරන්නා සේ, තිල්රස්කදෙක් එක්ලක්ෂසූසැටදහසක් යොදුන් සක්වළගල හිස පැනැ ගෙණැ ඉතිරැ දිවන්නට වන. මුළුලොවැ කිණිහිරිමල් ඉස්නාසේ, පිරිසිදු යහපත් වැ පිපි සපුපෙත්තෙන් අහස වසන්නා සේ, දෙවියන් අනුභව කරණ මහදඹගසැ මුලැ නැඟි රන්දළුයෙන් මුළුලොව වසන්නා සේ දිවැ ගත් රන්වන්රස්පතරෙක් මහපොළොව රන්පිඩල්ලක් සේ රඳමින්, මහාසාගරය විරුවාපු රන්රසයක් සේ රන්වන් කෙරෙමින්, සක්වළගල ගැසී හිස් පැනැ ගෙණැ, හැලි සිය දහස් සුවහස්

ගල්මුදුනෙන් හෙළා පරසක්වළ දිවන්නට වන. බඳුවද කැල බඳු වූ, සන්ධ්‍යාවලාපටල බඳු වූ, සිඳුරකල්කයට අපහාස කරන්නා වූ, පද්මරාගමාණික්‍යයෙහි පැහැයට නින්දා කරන්නා වූ, රත්මහරස්කඳෙක් නැඟී බුදුපුදයට බැඳැ ලූ රත් වියනක් සේ මුළුලෝ අහස වසා සිටැ ගත. දවහත්තරු සේ, රිදී රසධාරා සියදහසක් සේ, සරත්වලාකැළ සියදහස් සේ සුදු වූ බුදුරස්කඳ දිවෙමින් ඇඹරෙමින් සළාවැටුම් දෙමින් කපක් දවස් මුළුල්ලෙහි අඳුරු නුබුන් ලොකාන්තරිකනරකය ලක්‍ෂ ගණන් පහන් ඇවිළු වූ පහන්රුකක් සේ එකාලොක කෙරෙමින් දිවන්නට පටන් ගත.

(බුත්සරණ, වැලිවිටියේ සෝරත හිමි, සංස්.)

(ඇ) එ දවස් මිථ්‍යාදෘෂ්ටිකයන්ගෙනුත් සම්‍යක් දෘෂ්ටිකයන්ගෙනුත් බොහෝදෙන රැස්වූහ. මේ දෙපක්‍ෂයෙන් මිථ්‍යාදෘෂ්ටිකයෝ 'මේ බමුණාණන් ආරාධනා කොට ශ්‍රමන භවත් ගෞතමයන් ගෙටම කෙළේ නම් හුදෙක් දන් දෙන්ට මතු නොවෙයි. ප්‍රශ්න විචාරා වෙහෙස දෙන්ටය. ශ්‍රමණ භවත් ගෞතමයන්ට වන සිලගු බලම්හ'යි රැස්වූහ. සම්‍යක් දෘෂ්ටිකයෝ අද වූ කලී 'මේ සම්‍යක් සම්බුද්ධ නමැති සූර්‍ය්‍යතෙමේ සැඳහැ නැති බමුණානන්ගේ මිථ්‍යදෘෂ්ටි නමැති අඳුරු හරවනු නිසා දෙශනා නැමැති ආලෝකයත් ශරීරාලොකයත් එක්කොට යහපත් පෑයක් ගන්නට වයිති හනන්නාසේ අද ආලොක දෙකක් විහිදුවයි. අපිත් ගොසින් ඒ ආලොකයෙන් කෙළෙස් අඳුරු දුරු කරම්හ. සර්‍වඥ විලාස නමැති රසාඤ්ජනය ඇස ගාම්හ'යි රැස්වූහ. බමුණාණෝද වළඳවා අන්තයෙහි බුදුන් කරා එළඹ මිටි හස්නෙක හිඳ ප්‍රශ්න විචාරන්ට පටන්ගත්හ. කෙසේද යත් මහණ ගොයුමාණෙනි, සාලුවක් පමණ කැඳ වේවයි සැන්දක් පමණ බත් වේවයි අන් කිසිවක් වේවයි තොපට වේවයි තොපගේ සවුවන්ට වේවයි දන් නොදී පේත් නොව බණත් නො අසා හුදෙක් තොප කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් දෙව්ලොව ඉපැද දිව්‍ය සම්පත් ලබන්නෝ ඇත්දැ'යි විචාළහ.

(සද්ධර්ම රත්නාවලිය, ප්‍රාචීන භාෂෝපකාර සමිතිය, සංස්.)

(ඈ) එබස්අසා ප්‍රභාවතී කිපිසඳ කුදත් නැගීසිට ප්‍රභාවතීන් කරටිය අල්වා ඇතුළුගෙටදමා තොමෝ පිටත්ව දොර වසා දොර අදිනාලනුව ඇද අල්වාගෙන පින්මඳ නොකීකරු තෙනත්තිය තිගේ රුව කාට කුමක් කෙරේද අපි තොපගේ රූපයෙන් කා බී රැකෙන දෙයෙක් ඇද්ද යනාදීන් දොඩා බොධිසත්ත්වයන්ගේ ගුණ වර්‍ණනා කෙරෙමින් තෙල ප්‍රභාවතිය අරොහ පරිනාහයෙන් යුක්තවූ සිඬාඞගණා ප්‍රතිභාගවූ විශිෂ්ටවූ රූ ඇත්තෙමියි තිගේ රූප සෞන්‍දර්‍ය්‍යී හා ඒ රාජාධි රාජවූ කුසරාජොත්තමයන් හා සමානකොට නොසිතව කුසරජ්ජුරුවන්වහන්සේ අපරිමිත බලවාහනද මහානුභාවද මුක්තාමාණික්‍ය සංඛසීලාප්‍රවාල කනක රජතාදි මහාධන ඇති සේක. තිමද ගලිත හස්තිරාජයෙකු පරිද්දෙන් කිසිවක්හු විසින් වැලකිය නොහැකි කායබල ඇති සේක. අන්නපාණ වස්ත්‍රාභරණ ග්‍රාමක්‍ෂෙත්‍රාදී සියළු උපභොග පරිභොග වස්තුවෙන් සමෘඬවූ කාශි කෝෂලාදීවූ බොහෝ රාජ්‍යයට අධිපති සේක. සකලජම්බුද්වීපයෙහි අනන්ත රාජධානිවල ඒ ඒ රජදරුවන්ට අග්‍රරාජන්සේක ශත්‍රැජන නමැති මත්තහස්තීන් මධ්‍යයට වන් සිංහරාජයෙකු පරිද්දෙන් අභීත සිංහනාද ඇති සේක. කුරවිකෙවිල්ලන්ට බඳුවූ ලීලොපෙත ගීතස්වර ඇති සේක.

(පන්සිය පනස් ජාතක පොත, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, සංස්.)

(ලකුණු 28 යි)

02. දඹදෙණි අවධිය සිංහල සාහිත්‍ය ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් ලෙසින් හැඳින්විය හැකි දැ'යි පිරික්සන්න.

03. "අභිප්‍රායට අනුකූල වන සේ කතා වස්තු තෝරා ගැනීමෙහි ලා දක්වන සාමාර්ථ්‍යය කතුවරයකු සතු ප්‍රතිභාව විශද කරන්නකි." <u>අමාවතුර</u> ඇසුරින් මේ ප්‍රකාශනයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

04. විද්‍යාචක්‍රවර්තීන්ගේ රචනා ශෛලියෙහි පිළිබිඹු වන විශේෂත්වය <u>බුත්සරණ</u> ඇසුරින් පැහැදිලි කරන්න.

05. "ගැඹුරු දහම් කරුණු පොදු ජනතාවට සරල බසින් කියා දීමට දැරූ ප්‍රයත්නයක් ලෙස <u>සද්ධර්මරත්නාවලිය</u> හැඳින්විය හැකිය" නියමිත කතා වස්තු ඇසුරින් පහදන්න.

06. පන්සිය පනස් ජාතක පොත සිංහල ජන සමාජයේ සංස්කෘතික හර පද්ධතීන් පෝෂණය කිරීමෙහි ලා කවර දායකත්වයක් උසුලන්නේ දැ'යි සනිදර්ශනව විස්තර කරන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)